Permanent Mission of Sri Lanka to the UN, Geneva
***Tel*** **: (+41) 022 919 12 50,** ***Fax*** **: (+41) 022 734 90 84**
**E-mail**: mission@lankamission.org **Web**: www.lankamission.org

# ‘ශ්‍රී ලංකා ඡන්දය තුළින් ප්‍රතිපත්තිගරුක රාජ්‍යයෝ දුර්ලභ සහෝදරත්වයක් පෙන්නුම් කරති’ - තානාපති ආර්යසිංහ මහතා පවසයි

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේදී පසුගිය බ්‍රහස්පතින්ද පැවති ශ්‍රී ලංකාව පිළිබද ඡන්ද විමසීම ප්‍රතිපත්තිමය පදනමක් පිළිබඳ විශ්වාස කරන්නාවූ වර්තමාන මානව හිමිකම් කවුන්සිලය නියෝජනය කරන රාජ්‍යයන් සිය සහෝදරත්වය පෙන්නුම් කළ දුර්ලභ අවස්ථාවක් බව ජිනීවාහි එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ශ්‍රී ලංකාවේ නිත්‍ය නියෝජිත තානාපති රවිනාථ ආර්යසිංහ මහතා පැවසීය. වර්තමාන මානව හිමිකම් කවුන්සිලය බටහිර ජාතීන් වෙත වැඩි නැඹුරුවක් පවත්නා අවස්ථාවක සහ 2012 වසරේ පැවති ඡන්ද විමසීමේදී ශ්‍රී ලංකාව වෙත සහයෝගය ලබාදුන් බංග්ලාදේශය, චීනය, කියුබාව, ජිබුටි, ජෝර්දානය, රුසියාව, සවුදි අරාබිය යන රටවල් එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය නියෝජනය නොකරන්නාවූ අවස්ථාවක, මෙම රාජ්‍යයන් පිරිස ශ්‍රී ලංකාව වෙනුවෙන් නැගී සිටීම අගය කළ යුතු ක්‍රියාවක් බව හෙතෙම අවධාරණය කළේය. එසේම මෙවන් බලහත්කාරී මෙන්ම පූර්වාදර්ශ සපයන්නාවූ යෝජනාවකදී ශ්‍රී ලංකාව වෙනුවෙන් ඡන්දය ලබාදුන්, ඡන්දය දීමෙන් වැලකීසිටි මෙන්ම එම ඡන්දයට සහභාගී නොවෙමින් සිය විරෝධය දැක්වූ රාජ්‍යයන්ට මෙන්ම ශ්‍රී ලංකාව වෙනුවෙන් අනෙකුත් රාජ්‍යයන් ගේ සහයෝගය ලබාගැනීම සඳහා උපකාරීවූ රාජ්‍යයන්ටද තානාපතිවරයා සිය කෘතඥතා පූර්ව ස්තුතිය පළකළේය.

පසුගිය බ්‍රහස්පතින්ද (2013 මාර්තු 21) දින එක්සත් ජනපදය විසින් ගෙන ආ ශ්‍රී ලංකාව සම්බන්ධ මෙම යෝජනාවේදී රාජ්‍ය 47 කින් සමන්විත මානව හිමිකම් කවුන්සිලයෙහි රාජ්‍යයෝ 13 එයට විරුද්ධව ඡන්දය භාවිතාකරමින්ද, රාජ්‍යයෝ 8 ඡන්දය දීමෙන් වැලකී සිටීමෙන් හා එක් රාජ්‍යයක් ඡන්දය වර්ජනය කිරීමෙන්ද සිය විරෝධය පෑහ. ලෝකයේ සියලු කලාප නියෝජනය කරමින් කොන්ගෝව, ඉක්වදෝරය, ඉන්දුනීසියාව, කුවේටය, මාලදිවයින, මොරිටේනියාව, පාකිස්ථානය, පිලිපීනය, කටාර් රාජ්‍යය, තායිලන්තය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, උගන්ඩාව හා වෙනිසියුලාව මෙම යෝජනාවට විරුද්ධව සිය ඡන්දය ලබාදුන් අතර ඇන්ගෝලාව, බොට්ස්වානා, බුර්කිනා ෆාසෝ, ඉතියෝපියාව, ජපානය, කසක්ස්තානය, කෙන්යාව හා මැලේසියාව සිය ඡන්දය ප්‍රකාශකිරීමෙන් වැලකී සිටියහ. ගැබොන් රාජ්‍යය මෙම ඡන්දය වර්ජනය කළාය.

එසේම මම යෝජනාව සඳහා රාජ්‍යයෝ 25 පක්ෂව ඡන්දය දුන් අතර ඉන් බහුතරයක් ඇමෙරිකා එක්සත් ජනපදය, යුරෝපා සංගමය හා යුරෝපා සංගමයට බැඳීමේ බලාපොරොත්තුවෙන් සිටින්නාවූ රාජ්‍යයෝ වෙති. ඔස්ට්‍රියාව, චෙක් ජනරජය, එස්තෝනියාව, ජර්මනිය, අයර්ලන්තය, ඉතාලිය, මොන්ටිනීග්‍රෝ, පෝලන්තය, සපාඤ්ඤය, මෝල්දෝවාව හා ස්විට්සර්ලන්තය යන යුරෝපා සංගමය නියෝජනය කරන්නාවූ හා යුරෝපා සංගමයට බැඳීමේ බලාපොරොත්තුවෙන් සිටින්නාවූ රාජ්‍යයෝ, එක් රාජ්‍ය කාණ්ඩයක් ලෙස මෙහිදී සිය ඡන්දය භාවිතා කළ අතර ආජෙන්ටිනාව, බ්‍රසීලය, බෙනින්, චිලී, කෝස්ටරිකාව, ග්වාතමාලාව, අයිවරි කෝස්ට් රාජ්‍ය, ලිබියාව, පේරු, දකුණු කොරියාව හා සියරා ලියෝනය ඇමෙරිකා එක්සත් ජනපදය සමගින් සිය ඡන්දය මෙම යෝජනාවට පක්ෂව ලබාදුන්හ.

2012 මාර්තු මස පැවති ශ්‍රී ලංකාව සම්බන්ධ ඡන්ද විමසීමේදී රාජ්‍යයෝ 15 විරුද්ධව ඡන්දය ලබා දෙමින් හා රාජ්‍යයෝ 8ක් ඡන්දයලබා නොදෙමින් මුළු එකතුවක් ලෙස රාජ්‍ය 23ක් එම යෝජනාවට සහයෝගය දැක්වීම ප්‍රතික්ෂේප කළ අතර තවත් රාජ්‍යයෝ 24ක් එයට සහයෝගය දැක්වූහ.

එක්සත් ජාතීන්ගේ ශ්‍රී ලංකා නිත්‍ය නියෝජිත කාර්යාලයය
ජිනීවා

2013 මාර්තු 22